# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**2023 මැයි මස 26 වන දින**

**II වන කොටස**

**අතිරේකය**

**(2023.05.29 දින නිකුත් කරන ලදී)**


# එකතු කළ අගය මත බදු (සංශෝධන)

*(පෞද්ගලික මන්ත්‍රීවරයන්ගේ පනත් කෙටුම්පතකි)*

**2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත සංශෝධනය කිරීම පිණිස වූ පනත් කෙටුම්පතකි**

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඉරාන් වික්‍රමරත්න මහතා විසින් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීම පිණිසයි


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 10.00 තැපැල් ගාස්තුව : රු. 150.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

මේ ප්‍රඥප්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලබන යම් නියෝගයක් පාර්ලිමේන්තුව විසින් අනුමත කිරීමෙන් පසුව පමණක් බලාත්මක වන බවට සහතික වන පරිදි මේ පනත් කෙටුම්පත මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 2අ වන වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

**2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත සංශෝධනය කිරීම පිණිස වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:–

**ලුහුඬු නාමය**

1. මේ පනත 2023 අංක     දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**2002 අංක 14 දරන පනතේ 2අ වන වගන්තිය සංශෝධනය කිරීම**

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 2අ වගන්තියේ (2), (3), (4) සහ (5) වන උපවගන්ති ඉවත් කර ඒ වෙනුවට එහි (2) සහ (3) වන උපවගන්ති ලෙස බලාත්මක විය යුතු පහත දැක්වෙන අලුත් උපවගන්ති ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(2) (2) එවැනි සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු අතර, ඉන්පසු හැකි ඉක්මනින් පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා එම නියෝගය පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) එවැනි සෑම නියෝගයක්ම පාර්ලිමේන්තුව විසින් අනුමත කිරීමෙන් පසුව පමණක් බලාත්මක විය යුතු ය.".

**අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව**

3. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.